සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

9 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 'නාට්‍ය පෙළ' යනුවෙන් හඳුන්වන්නේ,

(i) නාට්‍ය පේළියයි. (ii) නාට්‍ය වැලයි. (iii) නාට්‍ය පිටපතයි. (iv) නාට්‍ය කතාවයි.

02 නාට්‍ය පෙළ තුළ ඇතුලත් අංගයක් නොවන්නේ,

(i) අනුශාංගික කලා (ii) රංග විධාන (iii) චරිත (iv) සංවාද

03 'කදා වළලු' නාට්‍ය නිර්මාණය කළේ,

(i) උම්මග්ග ජාතකය ඇසුරිනි. (ii) චුල්ල ධනුද්ධර ජාතකය ඇසුරිනි.

(iii) සේරිවාණිජ ජාතකය ඇසුරිනි. (iv) නලපාන ජාතකය ඇසුරිනි.

04 පහත නාට්‍ය අතුරින් ලෝකධර්මී නාට්‍ය දෙකක් ඇතුලත් පිළිතුර වන්නේ,

(i) කැලණි පාලම, රත්තරන් (ii) කැලණි පාලම, තට්ටු ගෙවල්

(iii) තට්ටු ගෙවල්, මනමේ (iv) තට්ටු ගෙවල්, කදා වළලු

05 රංග වස්ත්‍රාභරණ,

(i) ආංගික අභිනයට අයත් වේ. (ii) සාත්වික අභිනයට අයත් වේ.

(iii) වාචික අභිනයට අයත් වේ. (iv) ආහාර්ය අභිනයට අයත් වේ.

06 'අභිනය' යනුවෙන් අදහස් කෙරෙන්නේ,

(i) කාව්‍ය ශාස්ත්‍රයට අයත් සංකල්පයකි. (ii) වේෂ භූෂණ ආදියෙන් යුක්ත වීමකි.

(iii) පිටපත රචනා කිරීමයි. (iv) ඉදිරිට පැමිණවීමයි.

07 සමාරෝපය යනු,

(i) නළුවා රංගභූමි පාලකගේ විධානයක් මත වේදිකාවේ හැසිරීමයි.

(ii) නාට්‍ය පිටපත ප්‍රේක්ෂකයා වෙත ගෙන යන මාධ්‍යයයි.

(iii) රූපණ ශිල්පියා තම පෞද්ගලිකත්වය අමතක කොට අනෙකෙකුගේ ස්වරූපය ගැනීමයි.

(iv) නළුවන් විසින් පෙර පුහුණුව මත සිදු කරණ නෘත්‍යයයි.

08 නාට්‍යෝපකරණ,

(i) නාට්‍යයේ ක්‍රියාවලිය සමඟ බැඳී පැවතිය යුතුය.

(ii) නාට්‍යයේ ජවනිකා මාරු වන විට වෙනස් කළ යුතුය.

(iii) ශිල්පීය නිපුණත්වය ප්‍රකට වන සේ නිමා කළ යුතුය.

(iv) නළුවාගේ රංගය අභිබවා ඉස්මතු විය යුතුය.

09 හිම කන්ද දියවීමේ අභ්‍යාසය,

(i) ස්වසන අභ්‍යාසයකි. (ii) තාපන අභ්‍යාසයකි.

(iii) ශිථිලකරණ අභ්‍යාසයකි. (iv) සංවේදන අභ්‍යාසයකි.

10 භාව නිරූපණය අදාළ වන්නේ,

(i) ආංගික අභිනයටයි. (ii) වාචික අභිනයටයි.

(iii) සාත්වික අභිනයටයි. (iv) ආහාර්ය අභිනයටයි.

- **ප්‍රශ්න අංක 11 - 16 දක්වා පිළිතුරු සැපයීම සඳහා පහත වගුව ඇසුරු කරන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| බහින කලාව | ගජමන් පුවත | මූදු පුත්තු | හිරු නැති ලොව |
| වදින්න ගිය දේවාලේ | මධුර ජවනිකා | දේවතා එළි | මෝදර මෝල |
| හස්තිකාන්ත මන්තරේ | ආනන්ද ජවනිකා | ලියතඹරා | මේස |

11 ඉහත A තීරුවට ඇතුලත් නාට්‍ය නිර්මාණය කළේ,

(i) රංජිත් ධර්මකීර්ති (ii) සුගතපාල ද සිල්වා

(iii) එදිරිවීර සරච්චන්ද්‍ර (iv) ජයලත් මනෝරත්න

12 ඉහත B තීරුවට ඇතුලත් නාට්‍ය නිර්මාණකරු විසින් නිර්මාණය කළ වඩාත් ජනප්‍රිය නාට්‍යයකි.

(i) මනමේ (ii) තල මල පිපිලා (iii) නරිබෑණා (iv) දික්තලා කාලගෝල

13 රංජිත් ධරමකීර්ති විසින් නිර්මාණය කළ නාට්‍ය ඇතුළත් තීරුව වන්නේ,

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

14 C තීරුවෙහි ඇතුලත් නාට්‍ය නිර්මාණය කළේ,

(i) දයානන්ද ගුණවර්ධන (ii) ගුණසේන ගලප්පත්ති

(iii) ජයලත් මනෝරත්න (iv) සුගතපාල ද සිල්වා

15 ඉහත වගුව තුළ 'වාර්තා රංග' ඇතුළත් තීරුව වන්නේ,

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

16 'යෙර්මා' ඇසුරින් නිර්මාණය කළ නාට්‍ය වන්නේ,

(i) බහින කලාව (ii) ලියතඹරා (iii) මූදු පුත්තු (iv) මේස

- **ප්‍රශ්න අංක 17 - 20 දක්වා ප්‍රශ්න සඳහා නොගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

17 රංග අභ්‍යාසවල නිරත වීමෙන් අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ වන්නේ,

(i) ශරීරය නමනීය කර ගත හැකි වීමයි. (ii) හඬ තීව්‍ර කර ගත හැකි වීමයි.

(iii) සබකෝලය දුරු කර ගත හැකි වීමයි. (iv) සිරුර ස්ථූල කර ගත හැකි වීමයි.

18 අංග රචනය සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍ය වන්නේ,

(i) පදනම් ආලේපය (ii) නෝස් පොටි (iii) දිය සායම් (iv) ස්ප්‍රීට් ගම්

19 ළමා නාට්‍ය කාණ්ඩයට අයත් වන ළමා නාට්‍ය වන්නේ,

(i) තොප්පි වෙළෙන්දා (ii) වලහා සහ මාෂා

(iii) ටිකිරි මැණිකේ (iv) නරි බෑණා

20 බෞද්ධ ආගමික පූජාකර්ම වන්නේ,

(i) මිලින්ද ප්‍රශ්නය (ii) ආලවක දමනය

(iii) දොරකඩ අස්න (iv) ජාතක කතා පොත

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01 සිටු දුව :- මේ වළලුත් ගෙනාවේ කසී රටෙන්ද?

කච්ඡපුට :- (සිනාසී) කසී රටෙන් ? ඒ තරම් දුර යන්නෙ කව්ද වළලු ගේන්න ? ඇරත් කසී රට වළලු කියා අමුතු ජාතියක් තියෙනවද? කෝකත් එකයි.

(i) ඉහත සංවාදය උපුටාගත් නාට්‍ය නම් කරන්න. (ලකුණු 02)

(ii) එම සංවාදය තුළ ඇතුලත් රංග විධානයක් ලියන්න. (ලකුණු 02)

(iii) මීට පෙර සිටු දුවට හමු වූ වළලු වෙළෙන්දා කව්ද? (ලකුණු 02)

(iv) මෙම නාට්‍යයෙහි රංග ශෛලිය කුමක්ද? (ලකුණු 02)

(v) මෙම නාට්‍යයෙහි භාවිතා කළ ප්‍රධාන රංග භාණ්ඩ 02 ක් නම් කරන්න. (ලකුණු 02)

02 (i) ප්‍රධාන නාට්‍ය ශෛලීන් නම් කරන්න. (ලකුණු 02)

(ii) එම ශෛලීන්වලට අයත් නාට්‍ය 03 බැගින් ලියන්න. (ලකුණු 03)

(iii) එම ශෛලීන් අතරින් එක් ශෛලියක ලක්ෂණ පිළිබඳව ඔබ නැරඹූ නාට්‍යක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

03 (i) නාට්‍යමය ලක්ෂණ ඇතුලත් බෞද්ධ ආගමික පූජාකර්ම 4 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බෞද්ධ ආගමික පූජාකර්ම තුළ ඇතුලත් නාට්‍යමය ලක්ෂණ 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඉහත ඔබ සඳහන් කළ එක් බෞද්ධ ආගමික පූජා කර්මයක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04 (i) රංග අභ්‍යාස යන්න විස්තර කරන්න. (ලකුණු 02)

(ii) රංග ක්‍රීඩා 03 ක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ නම් කළ එක් රංග ක්‍රීඩාවකින් ලැබෙන ප්‍රයෝජන 05 ක් නම් කරන්න. (ලකුණු 05)

05 පහත සිද්ධිය ඇසුරු කොටගෙන රසවත් නාට්‍ය පිටපතක් රචනා කරන්න.

"පාසල් නිවාඩු දිනයේදී සුපුරුදු ලෙස වෙල අද්දර පිහිටි අඹ ගසට අඹ කැඩීමට පැමිණි සෙව්වන්දි, හංසිකා හා චමත් එකවරම වෙල් යාය දෙසින් ඇදී එන, මිනිසුන්ට සමාන අමුතු ජීවීන් දෙදෙනෙකු ඔවුන් දෙස බලා සිටිනු දකිති.... "

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (iii) 02. ( i ) 03. (iii) 04. ( ii) 05. (iv) 06. (iv) 07. (iii) 08. ( i ) 09. (iii) 10. (iii)
11. (iii) 12. (iii) 13. (iv) 14. ( ii) 15. ( ii ) 16. (iii) 17. (iv) 18. (iii) 19. (iv) 20. (iv)

## II කොටස

01 (i) කදා වළලු (ලකුණු 02)

(ii) සිනාසී (ලකුණු 02)

(iii) සේරිවාණිජ (ලකුණු 02)

(iv) නාට්‍ය ධර්මී (ලකුණු 02)

(v) වළලු කද, රන් තලිය (ලකුණු 02)

02 (i) ලෝක ධර්මී, නාට්‍ය ධර්මී (ලකුණු 02)

(ii) ලෝක ධර්මී - නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.
නාට්‍ය ධර්මී - නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න. (ලකුණු 03)

(iii) නිදසුන් සහිතව ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න. (ලකුණු 05)

03 (i) මිලින්ද ප්‍රශ්නය, දොරකඩ අස්න, ආලවක දමනය, සූවිසි විවරණ (ලකුණු 02)

(ii) අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය, රංග වස්ත්‍රාභරණ භාවිතය ආදී වශයෙන්. (ලකුණු 03)

(iii) නිවැරදිව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04 (i) රංගනයේ යෙදෙන ශිල්පීන් රංගනය සඳහා සුදුසු කායික, මානසික යෝග්‍යතාවය ඇති කර ගැනීමටත් තම හැකියා වර්ධනය කර ගැනීමටත් කරන අභ්‍යාස (ලකුණු 02)

(ii) රංග ක්‍රීඩා නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

(iii) නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05 නාට්‍ය පිටපත නිවැරදිව ලියා ඇත්නම් අහමත පරිදි ලකුණු ලබා දෙන්න.